**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

සභාව සතු ඉඩම් කට්ටි 05 ක වටිනාකම හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොම්පෝස්ට් අංගනයේ පැවති පොහොර තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ලැබියයුතු ගිණුම්.**
**--------------------**

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ අයිතම 06 ක එකතුව රු.72,416,396 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.49,094,066 ක් වී තිබුණි.

**1.3.3 ගෙවියයුතු ගිණුම්.**
**---------------------**

2015 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.29,210,793 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.7,365,596 ක් වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**---------------------------------**

ගිණුම් විෂයයන් 04 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.47,252,891 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 නියමය පරිදි සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂිකව වරක් පරීක්ෂා කරවීමට කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.16,481,289 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.19,628,643 ක් වූයෙන්, අතිරික්තයේ රු.3,147,354 ක අඩුවීමක් දක්නට ලැබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් අනුපාත කීහිපයක් පහත දැක්වේ.

**(අ) මෙහෙයුම් ආදායමට අතිරික්තය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක් තුළ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එම ප්‍රතිශතයේ පිරිහීමක් පෙන්නුම් කෙරේ.

**(ආ) මුළු ආදායම සහ මුළු වියදම සැසඳීම.**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 හී මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට මෙම ප්‍රතිශතයේ ඉහළ යෑමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් නොකෙරේ.

**(ඇ) සමුච්චිත අරමුදල.**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක සමුච්චිත අරමුදලේ ශේෂය අඛණ්ඩ අඩුවීමක් දක්නට ලැබුණි.

**(ඈ) අතිරික්තය.**

සමාලෝචිත වර්ෂයේ සමස්ත අතිරික්තය, ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය සමඟ සැසඳීමේදී රු.9,788,825 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2015 වර්ෂයේ ආදායම් විෂයයන් 02 ක අඩුවීම හා වියදම් විෂයයන් 03 ක වැඩිවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

## 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිඟය | 2015 වර්ෂයේ බිල්කීරීම් | අධි ගාස්තු | දුන් වට්ටම් | හිඟයෙන් ලැබීම් | බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 4,274,748 | 2,329,390 | 240,141 | 64,621 | 578,959 | 1,265,217 | 4,933,054 |
| අක්කර බදු | 1,023,444 | -- | -- | -- | -- | -- | 1,023,444 |
| බදු කුළී | 388,376 | 1,395,420 | 78,756 | -- | 354,635 | 1,054,286 | 453,631 |
| බලපත්‍ර | -- | 2,448,629 | -- | -- | -- | 2,448,629 | -- |
| වෙනත් | 33,712,713 | 24,935,615 | -- | -- | 3,611,446 | 19,276,287 | 35,760,595 |
| එකතුව | | | | | | | 42,170,724 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.42,170,724 ක හිඟ ආදායම් ශේෂයක් විය.

## 2.3.2 වරිපනම් බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට රු.4,274,748 ක් වූ හිඟ ශේෂයක් පැවති අතර, බිල් කිරීම් රු.2,329,390 ක් වී තිබුණි. මෙම ශේෂයන්ගෙන් වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 13 ක් හා සියයට 54 ක් වූයෙන්, සමාලොචිත වර්ෂයේ අවසාන දිනට රු.4,933,054 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි. එයින් වසරකට වැඩි රු.3,695,789 ක හිඟ ශේෂයක් පවතින නමුත්, එම මුදල් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 05 කට වරක් නව තක්සේරුවක් කර, වරිපනම් බදු අය කළයුතු වුවත්, සභාව අවසන් වරට 2008 වර්ෂයේ දී කර තිබූ වරිපනම් බදු තක්සේරුව මතම සමාලෝචිත වර්ෂයේ දීද වරිපනම් බදු අය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රජයේ ආයතන 08 කින් අය වියයුතුව තිබූ වරිපනම් බදු ශේෂය රු.1,134,384 ක් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.3.3 අක්කර බදු.

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.1,023,444 ක හිඟ ශේෂය වර්ෂ 03 කට පෙර සිට පැවත එන අතර, එම හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමර්ගයක් අනුගමනය කර නොතිබුණි.

### 2.3.4 කඩකුලී

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.388,376 ක හිග ශේෂයක් පැවති අතර, බිල් කිරීම රු.1,395,420 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.453,631 ක හිග ශේෂයක් පැවති අතර, ඉන් එක් කඩ කාමරයකින් වර්ෂ 03 ට පෙර සිට අය වියයුතු රු.231,410 ක ශේෂයක් මෙහි ඇතුළත්ව තිබුණි.

(ආ) සභාව සතු දෙල්තොට ප්‍රධාන වීදියේ කඩ කාමර 03 ක් බදු කාල සීමාව අවසන් වීමෙන් පසු නැවත ටෙන්ඩර් කැඳවා බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට රු.251,400 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන අනුව දීර්ඝකාලීනව බදු දී තිබුණ දෙල්තොට හා ගලහා පිහිටි කඩ කාමර 59 ක් බදු සංශෝධනයක් කර නොතිබුණි

### 2.3.5 ජල ගාස්තු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිවිසුම් ප්‍රකාරව ජල ගාස්තු අය නොකිරීමේ හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,693,378 ක හිග ශේෂයක් පැවති අතර, ජල පාරිභෝගිකයින් සමග ඇති කර ගත් ගිවිසුමේ 02(iv) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) හිග ජල ගාස්තු ශේෂය තුළ සාවද්‍ය ලෙස බිල් කරන ලද රු.1,123,120 ක අය නොවන ශේෂයක් පැවතුණි.

(ඇ) ජල යෝජනා ක්‍රම 08 ට අදාළ ජල පාරිභෝගිකයින් 3460 දෙනාගෙන් 2642 දෙනෙකුට ජල මනු සවි කිරීමකින් තොරව ස්ථාවර ගාස්තුවක් අය කර තිබුණි.

### 2.3.6 වෙනත් ආදායම්.

සමාලෝචිත වර්ෂයේ ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු වශයෙන් රු.846,000 ක් බිල් කිරීම් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.501,450 ක් අය වියයුතුව තිබුණි.

### 2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තුවල වටිනාකම රු.23,565,766 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 34 ක් පැවති අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කර, නොතිබීම හේතුවෙන් සමහර නිලධාරීන් විෂයයන් කීපයක වැඩ ආවරණය කරන බවක් නිරීක්ෂණය විය.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව සැළසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක් තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 644 කින් අයදුම්පත් 333 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 60 ක් සඳහා පමණි.

(ආ) 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය වියයුතු රු.29,635 ක හිග ණය ශේෂ අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

(ඇ) අනවසර ඉදි කිරීම් පිළිබඳව සභාවට ලැබී තිබූ පැමිණිලි අනුව, අනවසර ඉදි කිරීම් 10 ක් සම්බන්ධයෙන් අනවසර ඉදි කිරීම් කළ පුද්ගලයින් වෙත අනවසර නියෝග යැවීම පමණක් සිදු කර තිබුණු අතර, වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) බෙල්වුඩ් එගොඩගම කොළණිය මාර්ගයේ පැති බැම්ම සංවර්ධනය කිරීම - රු.694,215**

**------------------------------------------------------------------------------------**

ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 03 අනුව අගල් 6x9 ප්‍රමාණයේ කළු ගල් භාවිතා කළයුතු වුවත්, එම ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ ගල් යොදා ආරක්ෂිත බැම්ම ඉදි කර තිබුණු අතර, බැම්ම මතු පිට මි.මී.25 ප්‍රමාණයේ ඝනකමින් බදාම මිශ්‍රණය යෙදියයුතු වුවත්, ඉදි කර තිබූ බැම්මේ මතු පිට කපරාරු මිශ්‍රණය යොදා නොතිබුණි. ඇස්තමේන්තු ප්‍රකාරව 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් බදාම යොදා බැම්ම ඉදි කළයුතු වුවත්, පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල බදාම මිශ්‍රණයක් යොදා තිබූ අතර, කුස්තර නිසි ලෙස බදාම යොදා වසා නොතිබූ බව 2016 පෙබරවාරි 18 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

**(ආ) මොරගොල්ල සමන් දේවාල මාර්ගය සංවර්ධනය කිරීම - රු.300,000**

**----------------------------------------------------------------------**

කොන්ක්‍රීට් මාර්ග තලයේ එක් ස්ථානයක හරස් අතට ඉරි තලා පුපුරා ගොස් තිබුණි. එසේම, මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වල මට්ටමක පැවති අතර, හනිකොම් ලක්ෂණ මතුව තිබුණි.

**(ඇ) මොරගොල්ල සිට මහ වංගුව දක්වා ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම අදියර II - රු.190,000**

**--------------------------------------------------------------------------------------**

කොන්ක්‍රීට් මාර්ග තලයේ එක් ස්ථානයක හරස් අතට ඉරි තලා පුපුරා ගොස් තිබුණි. එසේම, මාර්ග තලය දෙපස කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වලව පැවති අතර, හනිකොම් ලක්ෂණ දක්නට ලැබුණි. එම කොටස් පහසුවෙන් අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වලව තිබූ බව 2016 පෙබරවාරි 18 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අණාවරණය විය.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද, අයවැයගත හා තථ්‍ය, ආදායම් විෂයයන් 28 ක සියයට 09 සිට සියයට 100 ඉක්මවා ද හා වියදම් විෂයයන් 52 ක සියයට 11 සිට සියයට 99 දක්වා ද, සැළකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 31 ක් සඳහා සළසා දී තිබුණු රු.4,457,434 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අතර, ආදායම් විෂයයන් 05 ක රු.188,518 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණි.

(ඇ) පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර, ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරීන්ගෙන් ඇස්තමේන්තු ලබා ගෙන එකී ඇස්තමේන්තුගත වටිනාකම අනුව අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව කර්මාන්ත 101 ක් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රු.8,409,000 ක් හා පොදු සංවර්ධන කටයුතු සඳහා රු.8,140,707 ක් ලෙස දළ අගයක් යොදා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ප්‍රකාශය අනුව, සභා වත්කම් සියල්ල සඳහා ඔප්පු ලිවීම, වැට මායිම් යොදා දේපළ නිරවුල් කර ගැනීම, අනුරගම, උනුවින්න සහ බොරගොල්ල ගම්මාන සඳහා ජල යෝජනා ක්‍රම ආරම්භ කිරීම, වරිපනම් බල ප්‍රදේශය පුළුල් කිරීම හා බෙල්වුඩ් ශ්‍රියාගම හන්දියේ සති පොළක් ආරම්භ කිරිම ප්‍රධාන අරමුණ වී තිබුණ ද, එකී ව්‍යාපෘතීන් ආරම්භ කර නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය.

#### 4.2.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත සම්පත්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ 06 කට පෙර මොරගොල්ල සභා භූමියෙන් කපා ඉවත් කරන ලද ටර්පන්ටයින් ගස් 02 කින් හා ෆයිනස් ගස් 02 කින් ඉරන ලද රු.456,575 ක වටිනා ලී තොගය, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන, ලේඛනගත කිරීමකින් ද තොරව සභා ගබඩාව තුළ ගොඩ ගසා තිබුණි.

(ආ) රු.19,853,679 ක් වටිනා වාහන 05 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

**5. පද්ධති හා පාලනය.**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධතිය | පද්ධතියේ අඩුපාඩු |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් | (i) සභාව සතු ගොඩනැගිලි ගිණුම්ගත නොකිරීම.<br>(ii) ඉඩම්වල අයිතිය තහවුරු කර නොගැනීම. |
| (ආ) තොග පාලනය | (i) ගබඩා ද්‍රව්‍ය මිල දී ගැනීම් හා නිකුත් කිරීමේ දුර්වලතා පැවතීම.<br>(ii) අභාවිත තොග පැවතීම. |
| (ඇ) වාහන පාලනය | (i) වාහන ධාවන සටහන් නිසි පරිදි නඩත්තු නොකිරීම.<br>(ii) වාහනවල ආරක්ෂාව නිසි පරිදි සිදු නොවීම.<br>(iii) වාහනවල අයිතිය පවරා නොගැනීම. |
| (ඇ) ආදායම් පරිපාලනය | (i) හිඟ හිටි ආදායම් රැස් කිරීම දුර්වලව පැවතීම.<br>(ii) ආදායම් රැස් කිරීමේ ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) ප්‍රමිතියෙන් තොරව ඉදි කිරීම් සිදු කිරීම.<br>(ii) පසු විපරම් කටයුතු සිදු නොවීම.<br>(iii) අධීක්ෂණ කටයුතු දුර්වල වීම.<br>(iv) ඉදි කිරීම් අවසන් නොකිරීමෙන් ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවීම. |